# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2021-02-01

පැමිණිලි පාර්ශවය : ටී. දමයන්ති අමුගොඩ මිය,
නබඩගස්වැව,
රඹෑව.

වගඋත්තර පාර්ශවය : ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
රඹෑව.

පැමිණිලි අංකය: ***HRC/AP/476/2015(W)***

**පැමිණිල්ල :-**

තම මව වන කපුරුහාමිගේ බිසෝ මැණිකා යන අයට ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබාදී ඇති අනු/රඹෑ/101/නබඩ/10 හා 2014.11.12 දිනැති අවසර පත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණය කිසිදු සාධාරණ හේතුවකින් තොරව සංශෝධනය කිරීමට කටයුතු කිරීම මඟින් ද, ඊට අදාළව කටයුතු කිරීමේදී නීතියට පටහැනිව කටයුතු කිරීමෙන්ද, වගඋත්තරකාර පාර්ශවය විසින් සිය මූලික අයිතිවාසිකම් කඩ කරන ලද බවට මෙම පැමිණිල්ල මඟින් කරුණු ඉදිරිපත් කර ඇත.

ඒ අනුව පැමිණිලිකාරිය සඳහන් කර ඇත්තේ, තම පියා විසින් 1976 වර්ෂයේ සිට රජයේ ඉඩමක අනවසරෙන් පදිංචිව එකී ඉඩම සංවර්ධනය කරන ලද බවත්, 1976 සිට 1994 වර්ෂය දක්වා සංවර්ධනය කිරීමෙන් අනතුරුව පියා ඇතුළු පවුලේ අය එම ඉඩම් කොටසෙන් ඉවත් කිරීමට කටයුතු කළ අවස්ථාවේ ඊට අදාළව අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීමෙන් පසු අධිකරණයේ තීන්දුවට අනුව පැමිණිලිකාරියගේ පියාට රජයේ ඉඩම් අක්කර භාගයක් පදිංචිය සඳහා භාරදීමට තීරණය වූ බවත්ය. ඒ අනුව එවකට රඹෑව ප්‍රාදේශීය ලේකම්ගේ 1994.02.02 දිනැති ලිපිය මඟින් අක්කර භාගයක කොටසක මායිම් පෙන්වා එකී ඉඩම් කොටස සංවර්ධනය කර භුක්ති විඳීම සඳහා පැමිණිලිකාරියගේ පියාට භාර දුන් බවත් ප්‍රකාශ කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ඒ අනුව 1976 වර්ෂයේ සිට මේ දක්වා වසර 40කට ආසන්න කාලයක් තම පවුලේ අය එකී ඉඩම් කොටස තුළ පදිංචිව සිටින බවත්, 1994.02.02 දින සංවර්ධන සඳහා භාරදුන් ඉඩමට බලපත්‍රයක් ලබා ගැනීමට එතැන් සිට දිගින් දිගටම ඉල්ලීම් කළ බවත් පැමිණිල්ලෙන් ප්‍රකාශ කර ඇත. එසේ තිබියදී තම පියා 2003.11.10 දින මිය යාමෙන් අනතුරුව 2004.02.29 දින මරණාධාර සමිති නිලධාරීන් පිරිසක් තම පවුලේ අය සමඟ තිබූ පෞද්ගලික අමනාපයක් හේතුවෙන් පැමිණිලිකාරිය හා පවුලේ අය සංවර්ධනය කරමින් භුක්ති විඳිමින් සිටි ඉඩමෙන් කොටසක් බලහත්කාරයෙන් අල්ලාගෙන ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කළ බවත්, ඒ අවස්ථාවේදී ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් දැනුවත් කළ පසු එකී ඉදිකිරීම් ප්‍රාදේශීය ලේකම්ගේ 2004.03.20 දිනැති ලිපියේ නියෝග ප්‍රකාරව අත්හිටුවන ලද බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී ඇතිවූ තත්වය මත සාමාජික අංක 64 යටතේ දීර්ඝ කාලයක් පැවති මරණාධාර සමිතියේ සාමාජිකයත්වයද අසාධාරණ ලෙස අහෝසි කරන ලද බවත්, පැමිණිල්ල විසින් ප්‍රකාශ කර ඇත.

එසේම භුක්ති විඳින ඉඩම් කෙටස සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් 2013.12.12 දින පැවති ඉඩම් කච්චේරියෙන් තෝරා ගන්නා ලද අවසර පත්‍රලාභීන්ගේ නාම ලේඛනයක් ග්‍රාම නිලධාරී කාර්යාලයේ ප්‍රදර්ශනය කර තිබූ අතර, <u>එහි අනු අංක 22 යටතේ කේ.බිසෝ මැණිකා වන පැමිණිලිකාරියගේ මවගේ</u> නමින් තේරීම් ලැබුණු ඉඩම් ප්‍රමාණය අක්කර භාගයක් ලෙස සඳහන් කර තිබූ බවත් පැමිණිල්ල වැඩිදුරටත් සඳහන් කර ඇත.

ඒ අනුව 2014.11.12 දින එවකට ප්‍රාදේශීය ලෙකම්ගේ අත්සනින් යුතුව ප්‍රමාණයෙන් අක්කර භාගයක් ලෙස සඳහන් වූ අංක අනු/රඹෑ/101/නබඩ/10 දරණ අවසර පත්‍රය තම මවගේ නමින් ලැබුණු බවද පැමිණිල්ල විසින් ප්‍රකාශ කර ඇත. එසේම 2015.06.11 දින ඉහත කී අවසර පත්‍රයේ පසුඋරුමකාරිය ලෙස පැමිණිලිකාරියගේ නැගණිය නම් කරන අවස්ථාවේදීද ඉඩම් ප්‍රමාණය අක්කර භාගයක් ලෙස සඳහන්ව තිබූ බවද ප්‍රකාශ කර ඇත.

එසේ තිබියදී 2015.09.04 දින පැමිණිලිකාරියගේ නිවසට පැමිණි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන ජනපද නිලධාරියෙකු විසින් ඉහත කී අවසර පත්‍රය ඉල්ලා ගෙන ගොස් නැවත 2015.09.11 දින නිවසටම ගෙනවිත් භාරදුන් බවද, නැවත ගෙනවිත් දුන් බලපත්‍රය පරීක්ෂා කිරීමේදී ඉඩම් ප්‍රමාණය අක්කර කාලක් ලෙසට සංශෝධනය කර තිබූ බවද ප්‍රකාශ කර ඇත. ඒ අනුව බලපත්‍රය නිකුත් කළ නිලධාරියාගේ හා බලපත්‍රය ලබාගත් මවගේ අත්සන හා දිනය එලෙසම තිබියදී වසර දෙකකට පමණ පසු ඉහත පරිදි බලපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණය සංශෝධනය කිරීම අයුක්ති සහගත බවට පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත.

වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණුවල සාරාංශය

ඉහත කී පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් 2015.10.28 දිනැති ලිපිය මගින්ද, 2016.01.28 දින පැවති මූලික පරීක්ෂණයේදී ද, 2016.02.23 දිනැති වැඩිදුර වාර්තා මගින්ද කරුණු ඉදිරිපත් කර ඇත.

ඒ අනුව පැමිණිලිකාරියගේ මව වන කේ.බිසෝ මැණිකා නමින් බලපත්‍රයක් ලබා දී ඇති ඉඩම් කොටස අ.ග.පි.537 නබඩගස්වැව කැබලි අංක 261 යටතේ රජයේ බෙහෙත් ශාලාවක් සඳහා වෙන් කරන ලද භූමි කොටසක් බව වගඋත්තර පාර්ශවය විසින් සිය කරුණු දැක්වීමේදී සඳහන් කර ඇත. අනවසරෙන් භුක්ති විඳිම පදනම් කරගෙන ඉහත කී බිසෝ මැණිකේ යන අය විසින් බලපත්‍රයක් ඉල්ලීම් කර තිබූ බවත්, රජයේ අවශ්‍යතාවයක් සඳහා වෙන්කර තිබූ ඉඩමක අනවසරෙන් පදිංචිව භුක්ති විඳින අය ඉවත් කිරීමට නීතියෙන් අවස්ථාව ඇතත්, එවකට ප්‍රාදේශීය ලේකම් විසින් අනවසරකාරිය පිළිබඳව සානුකම්පිතව සිතා රජයේ ගොඩනැගිලිවල පිහිටීම ද ඉදිරි අවශ්‍යතාද සැළකිල්ලට ගෙන රූඩ් 01ක් සඳහා බලපත්‍ර ලබාදීම නිර්දේශ කර ඇති බවත්, බලපත්‍රය ලිවීමේදී වැරදීමකින් එය රූඩ් 02ක් ලෙස සඳහන්ව ඇති බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව ජනපද නිලධාරී මගින් මෙම වැරැද්ද පිළිබඳව බලපත්‍රකාරිය දැනුවත් කර බලපත්‍රයේ ප්‍රමාණය රූඩ් 01ක් ලෙස නිවැරදි කරන ලද බවද ප්‍රකාශ කර ඇත.

විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකාරියගේ පියා වන වී.ඩී.අමුගොඩ හා ඔහුගේ පවුලේ අය පැමිණිල්ලේ සඳහන් ඉඩම් කොටස තුළ 1976 වර්ෂයේ සිට අඛණ්ඩව පදිංචිව සිටි බවට පැමිණිල්ල වෙතින් කරුණු ඉදිරිපත් වී ඇති අතර, එම කරුණු වගඋත්තරකාර පාර්ශවය විසින් කිසිදු අවස්ථාවක ප්‍රතික්ෂේප කර නොමැත.

1993 වර්ෂයේදී පැමිණිලිකාරියගේ පියා අනවසර ඉඩමෙන් ඉවත් කිරීම සඳහා ඉදිරිපත් වූ නඩුවකදී ඇති කරගත් එකගතාවය මත පදිංචිය සඳහා පැමිණිලිකාරියගේ පියාට අක්කර භාගයක් (රූඩ් 02ක්) ලබාදීමට නියම වූ බව පැමිණිල්ල විසින් ප්‍රකාශ කර ඇතත්, එවැනි අධිකරණ තීන්දුවක් හෝ සමථ සටහනක් පිළිබඳ ලේඛන කිසිවක් ඉදිරිපත් වී නැත. එසේවුවද අංක NCP/RB/5/1/9/19 හා 1994.02.02 දිනැති ලිපිය මගින් පැමිණිලිකාරියගේ පියා වන වී.ඩී.අමුගොඩ යන අයට ඉඩම් අක්කර භාගයක් පෙන්වා භාරදෙන ලෙසට එවකට ප්‍රාදේශීය ලේකම් විසින් ජනපද නිලධාරී වෙත ලිඛිතව දැනුම් දී ඇති බවට කරුණු තහවුරු වී ඇත.

එසේම 2003.06.18 දින එවකට ප්‍රාදේශීය ලේකම් විසින් නිවාස සංවර්ධන අධිකාරියේ කළමණාකරු වෙත නිකුත් කරන ලද NCP/RB/5/1/10/17(II) ලිපිය මගින්ද, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් ජංගම බෙහෙත් ශාලාව පිහිටි ඉඩමට යාබදව ඇති ඉඩම් කොටසේ වී.ඩී.අමුගොඩ යන අය ස්ථිර

නිවසක් සාදා පදිංචිව සිටින බවටත්, එම අය නමින් බලපත්‍රයක් ලබාදීම සඳහා ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇති බවටත්, අනුමැතිය ලද වහාම බලපත්‍ර ලබාදෙන බවටත් දැනුම්දී ඇත.

තවද 2004.03.01 දින එවකට ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද ලිපියක් මගින් ඉඩම සම්බන්ධයෙන් පවතින ආරවුල විසඳෙනතුරු මරණාධාර සමිති ශාලාව ඉදිකිරීම නවත්වමින් නියෝගයක් ලබා දී ඇත.

එසේම 2013.12.12 දින 2008/04 චක්‍රලේඛනයට අනුව බොරළු හින්න ප්‍රජා ශාලාවේ දී පවත්වා ඇති ඉඩම් කච්චේරියේ සුදුස්සන්ගේ නාම ලේඛනයට අනුව පැමිණිලිකාරියගේ මවගේ නම අංක 22 යටතේ සඳහන්ව ඇති අතර, එහි නිර්දේශිත ඉඩම් ප්‍රමාණය රූඩ් 02ක් ලෙස සඳහන්ව ඇති බවද පෙනී යයි.

තවද පැමිණිලිකාරිය වෙත 2014.11.12 දින නිකුත් කර ඇති අංක අනු/රඹෑ/101/නබඩ/10 දරණ අවසර පත්‍රයේ ඉඩම් ප්‍රමණය රූඩ් 02ක් ලෙස සඳහන්ව ඇති බවද නිරීක්ෂණය වන අතර, එකී බලපත්‍රයේ ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 3/සං/4/අනු/රඹෑව හා 2013.04.03 දිනැති ලිපියෙන් අනුමත බවද, 2013.12.12 දින අංක 22 යටතේ ඉඩම් කච්චේරියෙන් තෝරා ගන්නා ලද බවද සඳහන් කර ඇත. එසේම එම අවසර පත්‍රයේ ප්‍රමාණය පසුව සංශෝධනය කර රූඩ් 01ක් ලෙස සංශෝධනය කර ඇති බවද පෙනී යයි.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකාරියගේ පියා ඇතුළු පවුලේ අය පැමිණිල්ලට අදාළ ඉඩමේ දීර්ඝ කාලයක් අනවසරෙන් පදිංචිව සිට ඇති බව නිරීක්ෂණය වන අතර, එසේ පදිංචිව සිටියදී අක්කර භාගයක කොටසක් 1994.02.02 දිනැතිව පැමිණිලිකාරියගේ පියාට සංවර්ධනය කර භුක්ති විඳීම සඳහා විධිමත්ව භාර දී ඇති බවද නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකාරියගේ මව වන කේ.බිසෝ මැණිකා නමින් රූඩ් 02ක ප්‍රමාණයක් සඳහා විධිමත් තේරීමක් ඇති බව පෙනී යන අතර, ඊට අනුව බලපත්‍රය ද විධිමත්ව නිකුත් කර ඇති බවද පෙනී යයි. එසේ තිබියදී බලපත්‍රයේ ප්‍රමාණය කිසිදු සාධාරණ පදනමකින් තොරව සංශෝධනය කිරීම සිදුකර ඇති බවද මෙහිදී පෙනී යයි.

නිගමනය :-

පැමිණිලිකාරියගේ පවුලේ අය දීර්ඝ කාලීනව සංවර්ධන කර භුක්ති විඳීමෙන් පසුව ද පදිංචිය සඳහා විධිමත්ව භාරදීමෙන් පසුවද එකී භාරදුන් රූඩ් 02ක ප්‍රමාණය සඳහා පැමිණිලිකාරියගේ මව ඉඩම් කච්චේරියක් මඟින් විධිමත්ව තෝරා ගැනීමෙන් පසුව ද, එකී රූඩ් 02ක ප්‍රමාණය සඳහා අවසර පත්‍රය විධිමත්ව පැමිණිලිකාරියගේ මවට නිකුත් කර ඇති බව මෙහිදී නිගමනය කළ හැක.

එසේ තිබියදී එකී අවසර පත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණය රූඩ් 01ක් ලෙසට සංශෝධනය කිරීමට කිසිදු නීත්‍යානුකූල පදනමක් වගඋත්තරකාර පාර්ශවය මඟින් ඉදිරිපත් කර නැත. බලපත්‍රයේ ප්‍රමාණය රූඩ් 01ක් ලෙස සඳහන් විය යුතු වුවද, වැරදීමකින් රූඩ් 02ක් ලෙස සඳහන් වූ බව වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර ඇතත්,

1994 වර්ෂයේදී පැමිණිලිකාරියගේ පියාට සංවර්ධනය කර භුක්ති විඳීමට රූඩ් 02ක ප්‍රමාණයක් විධිමත්ව භාරදී තිබීමත්, රූඩ් 02ක් සඳහා විධිමත් තේරීමක් පැමිණිලිකාරියගේ මවගේ නමින් තිබීමත්, සහ එකී රූඩ් 02ක ප්‍රමාණය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ලැබීතිබීමත් සිදුව තිබියදී, එම ප්‍රමාණය රූඩ් 01ක් ලෙස වියයුතු බවට වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කරන්නේ කුමන පදනමක් මත ද යන්න පැහැදිලිතාවක් නොමැත. තවද වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කරන පරිදි වැරදීමක් සිදුවී ඇති බවට කිසිදු ලේඛනයක් මඟින් කරුණු තහවරු කර නොමැති හෙයින් වගඋත්තරකාර පාර්ශවය විසින් හිතාමතාව අසත්‍ය ප්‍රකාශයක් සිදුකරන බව කොමිෂන් සභාවට පෙනී යයි.

මෙම සමස්ත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී වගඋත්තර පාර්ශවය විසින් ගෙන ඇති අත්තනෝමතික ක්‍රියාමාර්ගය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට ආරක්ෂා කර දී ඇති මූලික අයිතිවාසිකම් පැමිණිලි පාර්ශවය සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. අවිධිමත්ව සංශෝධනය කර ඇති අවසර පත්‍රය නැවත නිවැරදි කර පැමිණිලිකාරියගේ මවගේ නමින් තේරීමේ ඇති ආකාරයට රූඩ් 02ක් සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමටත්, එකී රූඩ් 02ක ප්‍රමාණය විධිමත්ව මැන මායිම් පෙන්වා දීමටත් කටයුතු කළ යුතු බවට වගඋත්තරකාර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. එසේ රූඩ් 02ක ප්‍රමාණය ලබාදීමට ප්‍රායෝගික අපහසුතාවයක් පවතින්නේ නම් පැමිණිල්ලට අහිමි වන රූඩ් 01ක ඉඩම් කොටස වෙනුවෙන් වෙනත් ස්ථානයකින් හෝ රජයේ ඉඩම් කොටසක් ලබාදීමට පියවර ගත යුතු බවට වගඋත්තරකරු වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021.03-01 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anushya Shanmuganathan
Commissioner
Human Rights Commission of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

B/h